රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :- 11/2006 (I)

මගේ අංකය :- ආ/7/3/2/23
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2008.03.26

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>නිල වාහන සඳහා ඉන්ධන සැපයීම හා එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම.</u>**

අංක 11/2006 සහ 2006.07.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛය 2008.04.01 දින සිට බලාත්මක වන පරිදි පහත සඳහන් අයුරින් සංශෝධනය කරනු ලැබේ.

02. ඉහත චක්‍රලේඛයේ 02 වන ඡේදයේ සඳහන් ඇමුණුම 01 හි 1, 2, 3 සහ 4 තීරු වෙනුවට පහත සඳහන් පරිදි තීරු 01 හා 02 ආදේශ කරනු ලැබේ.

| | 1 | 2 |
|---|---|---|
| | පෙට්‍රල් / ඩීසල් වාහන සඳහා අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය. | ඉන්ධන සඳහා අනුමත උපරිම මාසික දීමනාව |
| **හිමිකම ලබන නිලධාරීන්** | | |
| (අ) අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධාරීන් | 180 | මසකට අනුමත ලීටර් ප්‍රමාණය X මාසයේ 1 වන දිනට පවතින ඉන්ධන මිල ගණන |
| (ආ) අමාත්‍යාංශයක අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධාරීන් | 150 | |
| (ඇ) දෙපාර්මේන්තු ප්‍රධානීන් හා ඒ හා සමාන නිලධාරීන් | 120 | |
| (ඈ) ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | 100 | |

**03.** උක්ත චක්‍රලේඛයේ **03** වන ඡේදයේ I හා II උපඡේද වෙනුවට පහත සඳහන් උපඡේද ආදේශ කරනු ලැබේ.

I. ඇමුණුම 01 හි පලමුවන තීරුවේ සඳහන් ඉන්ධන ප්‍රමාණයට ගෙවිය යුතු මුදල මාසික දීමනාවක් ලෙස දෙනු ලබන අතර එය ලදුපත් මත ගෙවිය යුතු ගෙවීමක් නොව අනුමත දීමනාවක් ලෙස ගෙවිය යුතුය.

II. සෑම මසකම 01 වන දිනට දේශීය වෙළඳ පොලේ පවතින ඉන්ධන මිල ගණන් පදනම් කරගෙන එම මාසයට හිමි ඉන්ධන දීමනාව තීරණය කළ යුතුය.

**04.** මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය